


# සද්ධර්ම මඩුව

# සධර්ම මධුව.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

භවත්‍රය වාසී සියල්ලෝම රාගාදී එකොළොස් විධ මහා ගින්නෙන් නිතර ඇවිල ගත්තෝම වෙති. සත්ත්වයෝ වනාහී ඒ මහා ගිනි ජලාවට ගිනී පෙනෙලිවී වාසය කරත්. එසේ හෙයින් සත්ත්වයන්ට සැපයක් නම් කොයින්ද? ප්‍රකෘති ගින්නෙන් තණ පරඬල් ආදිය දවන්නාක් මෙන් රාග, ද්වෙෂ, මොහ, ජාති, ජරා, මරණ, ශොක, පරිදෙව, දුක්ඛ, දෞර්මනස්ස, උපායාස යන ධර්මයෝ සියලු සත්ත්වයා නිතරම දවති: ඔවුනතුරෙන් රාගය නම්, ස්වකීය ස්කන්ධ පඤ්චකය කෙරෙහි හා බාහිර අවිඤ්ඤාණක, සවිඤ්ඤාණක වස්තූන් කෙරෙහි ඇලීම ලක්ෂණකොට ඇත්තේයි. රාගය සත්ත්ව සන්තානය තැවීම හා දැවීම කරණ හෙයින් ගින්නක් වැන්න. රාග ගින්න වනාහි අලොභ ධර්මයද ඒ හා සම්ප්‍රයුක්තවූ යහපත් සුඛ වෙදනාවද දවා විනාශ කරන්නේය. අලොභය වනාහි සක්විති රජහුගේ මාණික්‍ය රත්නය හා සදෘශවූ බෙහෙවින් පිරිසිදුවූ ධාතුවකි. මාණික්‍ය රත්නය වනාහි අසූචියෙහි හෝ මඩෙහි හෝ බහා තැබුනේවී නමුදු එය මදකුත් අපවිත්‍ර නොවේ. එපරිද්දෙන් ඒ අලොභ ධාතුව මනුෂ්‍යෛශ්වර්‍ය්‍ය නම්වූ අසූචියෙහිද දිව්‍යෛශ්වර්‍ය්‍ය නම්වූ අසූචියෙහිද බ්‍රහ්මෛශ්වර්‍ය්‍ය නම්වූ අසූචියෙහිද බහාලේ නමුදු ඒ ඓශ්වර්‍ය්‍යයන් හෙතුකොටගෙණ ස්වල්ප මාත්‍රයකුදු අපවිත්‍ර නොවේ. පෙහෙවස් සමාදන්වීම සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවීම අලොභ නමැති උද්‍යානය රොපනය කිරීම හා සදෘශ වේ. ඒ අලොභ නමැති උද්‍යානය ක්‍රමයෙන් වර්ධනයවී මාර්ග ඵල නිර්වාණ නම්වූ පුෂ්ප ඵල හට ගන්නාහුය.

සත්ත්වයෝ වනාහි අනවරාග්‍ර සංසාරයෙහි රොපිත අලොභ නැමැති උද්‍යාන කරණ අවස්ථාවෙහිම රාග ගින්නෙන් දවා හළු කරති. අද පෙහෙවස් සමාදන්වීමෙන් අලොභ නැමැති උද්‍යානය රෝපනය කරත්. හෙට ලොභාරම්මණය වැද ඒ උද්‍යානය දවා හළුකරත්. මේ භවයෙහි ප්‍රව්‍රජ්‍යාවීමෙන් අලොභ නැමැති උද්‍යානය රොපනය කරත්. පසු පසු භවයන්හි මනුෂ්‍ය ඓශ්වර්‍ය්‍ය දිව්‍ය ඓශ්වර්‍ය්‍ය:

අනුභව කරමින් ඒ උද්‍යානය දවා හළු කරත්. මේ භවයෙහි පැවිදිව මේ භවයෙහිදීම එය හැර දමන්නවුන් කෙරෙහිද නිතරම ලොභය තුරු ගමන් කරන්නවුන් කෙරෙහිද කියයුත්තක් නොමැත්තේය. මේ කියන ලද්දේ අනවරාග්‍ර සංසාරයෙහි රැස් කරනු ලැබූ අලොභ නැමැති උද්‍යාන සමූහය රාගගින්නෙන් දවා හළුකරන්නාවූ ආකාරයයි. අලොභය සමග පහළ වන්නාවූ සුඛ වේදනාව වනාහි ප්‍රේත ලොක අසුර ලොකාදී ලොකයන්හි දුඃඛයන් කෙරෙන් මිදුනාවූ සැපය වේ. සදෙරෙහි නිතරම රූප රාග අරූප රාග ගින්න ඇවිලෙමින් පවත්නාවූ මේ ත්‍රිවිධ ලොකයෙහි සැපයක් නම් කෙසේ ඇතිවිය හැක්කේද? සත්වයාගේ චිත්ත සන්තානයෙහි ඒ ඒ වස්තූන් සම්බන්ධයෙන් රාගාග්නිය හටගැණීම ස්වභාවයෙකි. යම් රූපයක් දැක එය සුභ නිමිත්ත වශයෙන් බාරගත් කල්හි පෙර නොවූ රාගාග්නිය හට ගන්නේය. එසේ හට ගන්නාවූ රාගාග්නිය නැවත නැවතත් ඇති වන්නට නොදී දුරුකර ගතහොත් යෙහෙකි. එසේ නොකරන ලද්දේ නම් ඒ රාගාග්නිය සත්වයාගේ චිත්ත සන්තානය දවමින් තවමින් නැවත නැවතත් ඒ වස්තුව ලබන තෙක්ම පහළ වන්නේය. ලැබූ කල්හිද ඒ ගැන සතුටුවීම් වශයෙන් නැවත නැවතත් රාගාග්නිය හටගන්නේය. ඒ වස්තුව ආරක්‍ෂා කිරීම් සම්බන්ධයෙන් උපමනා නොයෙක් දේ පිළිබඳවද නව නවත් රාගාග්නිය හටගන්නේය. මේ රාගාග්නිය ආගන්තුක හෙතු ප්‍රත්‍යයෙන් හටගන්නාවූ ස්වභාවයෙකි. මනුෂ්‍යයන්ගේ එක ස්කන්ධයෙක්හි අසූ කුලයක පණුවෝ පිරී සිටිත්. ඔව්හු ස්කන්ධයෙහි ඉපදෙමින් මැරෙමින් සිටින්නාවූ ආගන්තුක සත්වයෝය. ස්කන්ධ පඤ්චකයෙහි හෝ එයින් පිටත්හි හෝ දුර්ගන්ධය හමන්නාවූ ව්‍රණයක් නොහොත් පිළිකාවක් විද්‍යමාන වූයේ නම් එහි සංසේදජ පණුවෝ ඇති වන්නාහුය. ඔව්හු වනාහි ආගන්තුකයෝම වෙත්. එපරිද්දෙන් මේ රාගාග්නියද පහළවී නිරුද්ධවෙමින් පවත්නාවූ ආගන්තුක ධර්මයෙකි. ඒ ආගන්තුකවූ රාගාග්නිය ස්වසන්තානයෙහි පහළවනු නැමැත්තේ චිත්තම් ලොභ සහගත අරමුණෙහි චිත්තය පෙරදැරිව පහළ වන්නේය. ගිලන්වූ තැනැත්තාගේ සන්තානයෙහි යක්‍ෂයෙක් ආරූඪ වන්නාක්මෙන්ද, කැඩපතෙහි රූප ඡායාව ඇති වන්නාක්මෙන්ද, ආගන්තුකවූ රාගාග්නිය පහළ වන්නේය. කැඩපතෙහි ඇතිවුනාවූ රූප ඡායාව කැඩපතත් නොව මුහුණත් නොව ආගන්තුක දෙයකි. ඒ වස්තුවට හේතු කොට ගෙන පහළවූ ප්‍රතීත්‍ය සමුත්පාද ස්වභාවයෙකි. එමෙන්ම ස්ව සන්තානයෙහි හටගන්නාවූ රාගාග්නියද පහළ වෙමින් නිරුද්ධවෙමින් පවත්නාවූ ආගන්තුක පටිච්ච සමුප්පාද ස්වභාවයෙකැයි දත යුතු.

ඒ රාගාග්නියෙන් වෙන්වනු කැමතියන් විසින් අසුභ කර්මස්ථානය වැඩිය යුතුයි. එසේ වැඩීමෙන් ආගන්තුකවූ රාගාග්නිය නිවෙන්නේය. ඖෂධයෙකින් හෝ මන්ත්‍රයෙකින් හෝ ගිලන් කැනැත්තාගේ යක්ෂාවේශය හැරෙන්නාක් මෙන්ද, කඩපතෙහි ඡායාව අතුරුදන් වන්නාක්මෙන්ද, ආගන්තුකවූ රාගාග්නියද නිරුද්ධ වන්නේය. යථාභූත ඥානයෙන් තොරවූ අන්ධ බාල පෘථග්ජනයන්ට රාග සංඛ්‍යාත රැහැණින් බැඳී සිටින හෙයින් සංසාර වෘත්ත දුඃඛයෙන් මිදී යා නොහැක්කේය. මේ රාගයට තෘෂ්ණාව යයිද කියනු ලැබේ. සියලු වෘත්ත දුක්ඛයෙන් මිදෙනු කැමැති සත්ත්ව තෙම ප්‍රධාන වශයෙන් දුඃඛොත්පත්තියට හේතුවූ තෘෂ්ණාව සහමුලින් නැසිය යුත්තිය වදාරනලද මැයි.

"යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං"

යනුවෙන් යම්සේ ගසෙහි මුල නිරුපද්‍රතව ස්ථිරව සිටි කල්හි ඒ ගස කපන ලද්දේ වී නමුත් නැවත නැවතත් ලියලන්නේද එසේම සත්ත්වයාගේ චිත්ත සන්තාන ගතවූ තෘෂ්ණා සංඛ්‍යාත අනුශය ලෝකෝත්තර මාර්ග ඥානයෙන් නොනැසූයේ වී නම් ජාති ජරා මරණාදි මේ දුක්ඛය නැවත නැවතත් උපදනේමය.

සියලු රූප ස්කන්ධ නාම ස්කන්ධ රන්, රිදී, මුතු, මැණික්, දිව්‍ය විමාන බ්‍රහ්ම විමානාදිය තෘෂ්ණාවට හිතවූ ධර්මයෝමය. වර්ෂා කාලයෙහි පෘථිවියෙහි හටගන්නාවූ කුඩා පැලෑටි තෘෂ්ණාව හා සමාන යහ. ඒ පැලෑටි කුඩා අවස්ථාවෙහි සුවසේ උදුරා දැමිය හැකි වන්නාසේ තෘෂ්ණාව ඒ ඒ ආරම්මණයෙන්හි පහළවූ අවස්ථාවෙහිදීම සුවසේ උදුරා දැමිය හැක්කේය. ඒ කුඩා පැලෑටි ආදිය අවුරුදු ගණනක් ගතවීමෙන් ඉදිරීමට දුෂ්කර වන්නාක්මෙන් තෘෂ්ණාව නැවත නැවත ඉපදීමෙන් උපාදාන ස්වභාවයට පැමිණි කල්හි එයින් සුවසේ මුදවාලීමට නොහැකි වන්නේය තෘෂ්ණාව වනාහි සර්පයෙක් මැඩියෙකු තදින් අල්වන්නාක් මෙන් අරමුණ තදින් අල්වා ගන්නාවූ දුරු කිරීමට දුෂ්කරවූ ස්වභාවයෙකි. යම් වස්තුවක් ගැන හෝ පුද්ගලයෙකු ගැන හෝ හටගත්තාවූ . තෘෂ්ණාව පහසුවෙන් සිතින් පහ නොවේ. ඇතැම් කෙනෙක් මේ තෘෂ්ණාව හේතුකොට ගෙන ස්වකීය වස්තුවට වඩා අනුන්ගේ වස්තුව ගැන ආශා කෙරෙති එසේ සාමාන්‍ය තෘෂ්ණා මාත්‍රයෙහි නොසිට මෙරමා සතු වස්තුව තමා අයත් කරගනී. මේ තෘෂ්ණාව වනාහි ප්‍රමාදයට මුල් වන්නා-

වූද විවාද ඇති කරන්නාවූද දුඃඛ බවට පමුණුවන්නාවූද භවාශ්‍රයට ගියාවූ සත්වයා අපායට පමුණුවන්නාවූද ලොව ඇතිතාක් සියලු පව්වලට හේතුවන්නාවූද ස්වභාවයෙකි. පෘථග්ජන සියල්ලෝම තෘෂ්ණාව නිසා නොයෙක් ජාතිවලට පැමිණෙමින් වසන්නෝය. රාග සඞ්ඛ්‍යාත තෘෂ්ණාවෙන් යුත් සත්වයාට ආත්මාර්ථ පරාර්ථ දෙක නොදැනෙන බවත් රාගයෙන් යුත් සත්වයාට දශ කුශල කර්ම පථ සංඛ්‍යාත ධර්මය නොපෙනෙන බවත් යම් කාලෙක සත්වයාගේ සිත රාගයෙන් පෙළෙනු ලබන්නේද එකල්හි ඔහට මහ අඳුරක් වන බවත්,

**“රත්තො අත්ථං න ජානාති රත්තො ධම්මං න පස්සති**
**අන්ධං තමං තදා හොති යං රාගො සහතෙ නරං” යි**

වදාළ ගාථාවෙන් මනාකොට ප්‍රකාශවෙයි. මෙහි රාගයට ලොභ යයිද කියනු ලැබේ.

මීළඟට ලොභයට විරුද්ධ ධර්මයවූ අලොභය සම්බන්ධයෙන් කරුණු දක්වනු ලැබේ.

ලොභයට අලොභය තෙම ප්‍රතිපක්ෂය. අලොභය තෙම පඤ්චවිධ මසුරු මලට ප්‍රතිපක්ෂය. තවද අලොභය තෙම දානමය කුශල ක්‍රියාවට හෙතුවෙයි. අලොභයෙන් විද්‍යමාන දොෂය දොෂ වශයෙන්ම දරා දොෂයෙහි පිහිටයි. ලොභකොබ්වූ තැනැත්තේ දොෂ පිළිසන් කෙරෙයි. තවද අලොභයෙන් ප්‍රිය විප්‍රයොග දුකක් නොවෙයි. තවද ජාති දුක තෘෂ්ණාව මුල්කොට ඇති හෙයින්ද තෘෂ්ණාවට අලොභය ඉඳුරා ප්‍රතිවිරුද්ධ වන හෙයින්ද අලොභයෙන් ජාති දුකක් නොවෙයි. එසේම අලොභයෙන් ගෘහස්ථයන්ගේ සුඛ සංවාසභාවය වෙයි. විශෙෂ වශයෙන් ප්‍රෙත යොනියෙහි නොවුපදවයි බෙහෙවින් සත්වයෝ තෘෂ්ණාවෙන් ප්‍රෙත යොනියෙහි උපදිත්. අලොභය තෙම රාග වශයෙන් උපගමනය නොකෙරෙයි. අලොභය තෙම නෛෂ්ක්‍රම්‍ය සංඥාවද අසුභ සංඥාවද වඩන්නේය. අලොභයෙන් කාම සුඛල්ලිකානුයොග අන්තය පියයි. තවද අභිද්‍යා කාය ග්‍රන්ථය බිඳපියයි.

කායානුපස්සනා වෙදනානුපස්සනා සංඛ්‍යාත උභය සිවටන්හුගේ සමෘද්ධියට අලොභය ප්‍රත්‍යය වෙයි තවද මෙය නීරෝගී බවට ප්‍රත්‍යය වෙයි. නිර්ලෝභීවූ තැනැත්තේ ලොභ කටයුතුවූ අසත්ප්‍රායයන් සේවනය නො කෙරෙයි. එහෙයින්ම හෙතෙම නීරෝගීවෙයි. තවද අලොභය භොග සම්පත්තියට ප්‍රත්‍යයවෙයි. ත්‍යාගයෙන් භොග සම්පත්ති ප්‍රතිලාභය වෙයි. තවද මෙය දිව්‍ය විහරණ

යට ප්‍රත්‍යය වෙයි. තවද අලෝභයෙන් භෝග සම්පත්තිය පිළිබඳ ස්වකීය පක්ෂයෙහිවූ සත්ව සංස්කාරයන්හි නිවෘතවූයේ වෙයි. ඔවුන්ගේ විනාශයෙන් අභිසඞ්ග හේතුකවූ දුඃඛයාගේ අභාවය වන හෙයිනි. තවද අලෝභයෙන් අනිත්‍ය දර්ශනය වෙයි. ලෝභාභිභූ තැනැත්තේ උප භෝගාසායෙන් අනිත්‍යවූ සංස්කාරයනුදු අනිත්‍ය වශයෙන් නොදකී. අනිත්‍ය දර්ශනයෙන්ම අලෝභය වෙයි.

මෙසේ ලෝභයෙහි ආදීනව හා අලෝභයෙහි ආනිශංසත් දැන උතුම් සුවයට පැමිණෙනු කැමැත්තෝ භවයෙන් භවයට සසඹ යන් ගෙන යන්නාවූ රාගාග්නිය මාර්ග ඥානය වඩා සහ මුලින් නසත්වා!

මෙතෙකින් රාගාග්නිය සැකෙවින් දක්වන ලදී.

ද්වේෂය වනාහි ප්‍රකෘති ගින්නක්මෙන් සිත අතිශයින් දවන්නාවූ තවන්නාවූ ස්වභාවයෙකි. එහි ඇති දවන ස්වභාවය ද්වේෂයෙන් මඩනාලද සිත් ඇති පුද්ගලයා දෙස බැලීමෙන්ම දත හැකිය. සිත්හි ද්වේෂය හටගත් කල්හි එයින් පළමුකොට සිත දවයි. ඉක්බිති හෘදය ප්‍රදේශය හෝ මුළු ශරීරයම හෝ මැලවුනු බවට පමුණුවයි. එයින් ඒ පුද්ගලයාගේ මුඛ වර්ණය අතුරුදහන් වෙයි. ඒ ද්වේෂය යම්කෙනෙකුන්ගේ සන්තානයෙහි උපන්නේද ඒ පුද්ගලයා ඒකාන්තයෙන් යටත් පිරිසෙයින් විරූප බවට පැමිණවීමෙන් දූෂ්‍ය කෙරෙයි. ද්වේෂය සිත්හි පැහැදීම මනාකොට නසන බවද ශීලයාගේ කිළුටු බවද සිත්හි නොසන්සුන් බවද සිද්ධ කෙරෙයි. මෙය ප්‍රඥා නැමැති ප්‍රදීපාලෝකය නසන්නාවූද මනා පිළිපැදීම වළක්වන්නාවූද කුශල ධර්මයන් ලැබීමට හේතුවූ මාර්ගය නසන්නාවූද චතුර්විධ ලෝකෝත්තර ධර්මයන් ලැබීමට හේතුවූ ශීල සමාධි ප්‍රඥා සංඛ්‍යාත ද්වාරයන් නසන්නාවූද ධර්මයෙකි. එසේම ද්වේෂය සියලු විපත්තීන්ගේ හා උපද්‍රවයන්ගේ ඉපදීමට ස්ථානයකි. සියලු සතුරන්ගේ ඇතිවීමට හේතුවකි. මරණින් මතු අපායට පමුණුවන පාප ධර්මයෙකි.

යම් ද්වේෂයක් බිය උපදවයි නම් සතුරන් ඇති කෙරේ නම් සියලු අනර්ථ කරයි නම් ඒ ද්වේෂ චිත්තය හේතුකොට ගෙන භීතිය උපදවයි නම් ඒ දුක් විපාක ගෙනදෙන ද්වේෂය අඥාන ජනතෙම නොදනී. තවද ද්වේෂය බලවත් වීමෙන් පරපණ නසති. සමහර විට සිය පණද නසා ගනිති. පරපණ නැසීම් හේතුවෙන් අනන්ත ජාතියෙහි අපා දුකට මුවපානී. අවසානයෙහි ඉන් නිදහස් වූවද මිනිසත් බැවිහි මන්දායුෂ්ක වෙති. මෙරමාහට ආක්‍රෝශ කිරීම් පරි

කප කිරීම පීඩා කිරීම තැලීම් යනාදිය ද්වේෂ හෙතුවෙන්ම සිඩයි. එසේ මෙරමා හිරිගෙයට පැමිණවූයෝ උපනුපන් ජාතියෙහි නානා විධ ව්‍යාධි පීඩිතවූයෝ වෙති. ද්වේෂයට සමකළ හැකි ගින්නෙක් භුවනත්‍රයෙහිම අවිද්‍යමානය. මාර්ග ඥානයෙන් ද්වේෂය සර්වාකාරයෙන් දුරුකරනතෙක් භවත්‍රයවාසී සියල්ලෝම ද්වේෂාග්නියෙන් ඇවිල ගත්තෝම වෙති. මෙසේ ද්වේෂයාගේ වසඟයට ගියාහු සතතයෙන්ම දෙලොව අනර්ථ රාශියකට පැමිණෙති.

ද්වේෂ ගින්න වනාහි අද්වේෂයද ඒ අද්වේෂය සමග පහළ වන්නාවූ සුඛවේදනාවද දවා හළුකරදමයි. අද්වේෂයවනාහි දිව්‍ය රාජයන් පරිභෝග කරන්නාවූ ගොසින සඳුන්මෙන් අතිශයින් සිහිල්වූ ධර්මයකි. ඉතා රත්වූ උණුවතුරට ඒ සඳුන් දැමූ කල්හි එකෙණෙහි ඒ රත්වූ ජලය සිහිල්වෙයි. එපරිද්දෙන් අද්වේෂ ධර්මය ද්වේෂ නමැති ගින්නෙන් තැවෙන්නාවූ චිත්ත සන්තානයෙහි පහළ වූ කල්හි ද්වේෂ චිත්තයන් නිරුද්ධව සිහිල්වෙයි. පෙහෙවස් සම දන්වීම, පැවිදි වීම අද්වේෂ නමැති උද්‍යානය රෝපනය කිරීම හා සදෘෂවෙ. ඒ අද්වේෂ නමැති උද්‍යානය ක්‍රමයෙන් වර්ධනයවී යාමෙන් මාර්ගඵල නිර්වාණ නම්වූ පුෂ්ප ඵල හටගන්නාහුය. දැනට සිටින්නාවූ සත්ව යෝ අනවරාග්‍ර සංසාරයෙහි රැස්කරණලද අද්වේෂ නම්වූ උද්‍යාන සමූහය පුෂ්පඵල හට ගැණීමට තරම් වෘද්ධිභාවයට නොපමුණුවා ද්වේෂ ගින්නෙන් දවා හළුකරති. මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහිද ඇතැම්විට සියලු සත්වයෝ නිදුක්වෙත්වා යන මෛත්‍රී සිත චිත්ත සන්තානයතුල පහළවේ. නමුත් ඊර්ෂ්‍යා මාත්සර්‍යාදි අකුශල ධර්මයන් පහළවීමෙහිදී ද්වේෂයද පහළවී ඒ අද්වේෂ සියල්ලක් දවා හළුකර දමන්නේය. තවද ඇතැම් කෙනෙක් ප්‍රත්‍යුත්පන්න භව යෙහිම ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවී බ්‍රහ්ම විහාර ධර්මයන් වඩා මරණින් මතු බ්‍රහ්මලොකයෙහි උපදී. නමුත් ඔහුට එයින් චුතවී මනුෂ්‍යලොකයෙහි සොරෙක් හෝ වැද්දෙක් හෝ විය හැක්කේය. මේ ආදීන්ගේ වශයෙන් අනවරාග්‍ර සංසාරයෙහි රැස් කරණු ලැබූවාවූ අද්වේෂ උද්‍යානය ද්වේෂ ගින්නෙන් දවා හළු කරන්නාවූ ආකාරය දතයුතු. අද්වේෂය සමග යෙදුනාවූ සුඛ වේදනාව වනාහි අද්වේෂ උද්‍යානය වර්ධන භාවයට පමුණුවාගත් පුද්ගලයින් නිරය දුකින් මිදුනාවුන්ද මිනිස් ලොව්හි රෝගභය සතුරුභය ආදියෙන් මිදුන වුන්ද කරයි. ඔව්හු අල්පායුෂ්කයෝද නොවෙත්. මේ සත්වයෝ අනවරාග්‍ර සංසාරයෙහි රැස්කරණු ලැබූවාවූ අද්වේෂෝද්‍යාන සමූහය ද්වේෂ ගින්නෙන් දැවීම නිසා අද දවස දක්වාත් නිරයභය රෝග භය සතුරු භය යනාමෙයින් යුක්තව වාසය කරන්නාහුය. මෙසේ

ෂඩ්ද්වාරයෙහි නිරන්තරයෙන් ද්වේෂ ගින්නෙන් ඇවිලෙමින් පවත්නාවූ සත්වයන්ට දුකක් මිස සැබෑ සුවයක් නම් කොයින්ද?

යමෙක් තෙම කිපියාහට නැවත කිපේද ඒ කෝපයෙන් ඒ පසුව කිපී ගිය තැනැත්තාහටම පාපය වන්නේය. කිපුනු තැනැත්තාහට නොකිපෙන තැනැත්තේ දිනීමට අපහසුවූ සංග්‍රාමය දිනයි. සමෘති ඇත්තාවූ යමෙක් දුෂ්ට කිපී ගියාවූ අනිකෙකු දැන සංසිඳේද හෙතෙම තමාටද අන්‍යයාහටද යන දෙදෙනාටම වැඩ පිණිස හැසිරෙයි. ඒ ද්වේෂය තෙම දඬු මුගුරු කැට කැබිලිති ආදියෙන් ගසනු ලැබූ සර්පයෙකු මෙන් සිත ඉතා සැඩ පරුෂ කරවන සවභාව ඇත්තේ යයිද ලැව් ගින්නක් මෙන් තමාගේ නිශ්‍රයවූ සිත හා හෘදය වස්තුව දැවීම සවභාව ඇත්තේ යයිද අවකාශ ලත් සතුරෙකු මෙන් තමා හා අනුන්ද දූෂ්‍ය කිරීම සවභාව ඇත්තේ යයිද විෂ මිශ්‍ර කරණ ලද පූතිමූත්‍ර බෙහෙදක් මෙන් සර්වප්‍රකාරයෙන් තමාගේ හා අනුන්ගේ අභිවෘද්ධිය විනාශ කරණ සවභාව ඇත්තේ යයිද දත යුතුයි. යකඩෙහි උපන් මලය යකඩය විනාශ කරන්නාක් මෙන්ද, ගස් බෙනයෙන් හටගත්තාවූ ගින්න ඒ ගස දවන්නාක් මෙන්ද, ගිනි ගානා දණ්ඩෙන් හටගත්තාවූ ගින්න ඒ ගිනිගානා දඬු දවන්නාක්මෙන්ද වන ලැගැබෙහි හටගත්තාවූ ගින්න වන-ලැහැබ දවන්නාක්මෙන්ද සත්වයාගේ අධ්‍යාත්මික සන්තානයෙහි හටගත්තාවූ ද්වේෂාග්නිය මේ ජාතියෙහිත් තමාගේ ජීවිතය විනාශ කොට මරණින් මතු අපායට භාජන වෙයි. හෘදයාභ්‍යන්තරයෙහි අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය නොකිරීමෙන් අනුශය වශයෙන් සය නය කළාවූ ද්වේෂය අනිෂ්ටාරම්මණ සහ නවවිධ ආඝාත වස්තූන් නිසා උපදින්නේය. මෙසේ ද්වේෂය නිසා තමාට හා අනුන්ට වන්නාවූ අනර්ථයන් ඉතා විශාලය. එබැවින් මහා භයංකරවූ ද්වේෂාග්නියෙන් සිතරක්ෂා ගැණීමට ඉවසීම පුරුදු කළයුතුයි ඉවසීම ගැන මැදුම් සඟියෙහි පූර්ණ ස්ථවිරයන්ගේ කථාව දතයුතුයි. කිපුණු තැනැත්තේ අර්ථධර්මාදි කිසිවක් නොදන්න බවත් නීල පීතාදි රූප දැකීමෙහි අන්ධයකුමෙන් වන බවත්,

> කුද්ධො අත්ථං න ජානාති-කුද්ධො ධම්මං න පස්සති
> අන්ධංතමංතදා හොති-යං කොධො සහතෙ නරංසි”

වදාළ ගාථාවෙන් මනා කොට ප්‍රකාශවෙයි.

මේ කියනලද ද්වේෂයට අද්වේෂය තෙම ප්‍රතිපක්‍ෂය අද්වේෂය තෙම දුශ්ශීල්‍ය මලට ප්‍රතිපක්‍ෂය. සීලමය කුසල ක්‍රියාවට හේතු වන්නේය. මෙයින් විද්‍යමාන ගුණය ගුණ වශයෙන් ගෙන ගුණයෙහි පවතී. වෙසීවූ තැනැත්තේ ගුණවතකු වෙයි. තවද අද්වේෂ

යෙන් අප්‍රිය සම්ප්‍රයොග දුකෙක් නොවෙයි ජරා දුකෙක් නොවෙයි. බලවත් වෙෂය ඇත්තහුට යුහුව ජරාව ලැබෙන හෙයිනි. තවද අවෙෂයෙන් ගිහි පැවිදි සියල්ලවුන්ගේම සුඛසංවාසභාවය වෙයි. විශෙෂ වශයෙන් නරකයෙහි ඉපදීමෙක් නොවෙයි. මෙය වෙෂ වශයෙන් උපගමිතයාගේ අභාවය කෙරෙයි. තවද අව්‍යාපාද සංඥාවද අප්‍රාමාණ්‍ය සංඥාවද වන්නේය. තවද මෙයින් අනතකිලමථානුයොග අනතය පියයි. ව්‍යාපාදකාය ග්‍රන්ථය බිඳපියයි පූජිවූ දෙසී වටන්හුගේ සෞඛ්‍යයට ප්‍රත්‍යය වෙයි. යොවුන්බවට ප්‍රත්‍යයවෙයි අවෙෂීවූ තැනැත්තේ ඇඟ රැලි වැටීම් හිසකේ පැසීම් ආදිය කරන්නාවූ වෙෂාග්නි යෙන් නොදැවෙන්නේ බොහෝකල් තරුණ වෙයි තවද මෙය මිත්‍ර සම්පත්තියට ප්‍රත්‍යයවෙයි. අවෙෂ සංඛ්‍යාත මෛත්‍රියෙන් මිත්‍ර ප්‍රතිලාභය හා ලැබූ මිත්‍රයන්ගේ නොපිරිහීමද වෙයි. තවද බ්‍රහ්මවිහරණයට ප්‍රත්‍යය වෙයි. මෙයින් පරපක්ෂයෙහි වූ සත්වසංස්කාරයන්හි නිවෘතවූයේ වෙයි. අවෙෂීවූවහුට වෛරීන් කෙරෙහිත් වෛරි සංඥාභාවය වන හෙයිනි, මෙයින් දුක්ඛදර්ශනය වෙයි. අවෙෂ අදහස් ඇති තැනැත්තේ හරනා ලද ආඝාතවස්තු. පරිග්‍රහය ඇත්තේ සංස්කාරයන්ම දුක් වශයෙන් දකී. දුක්ඛ දර්ශනයෙන්ම අවෙෂය වෙයි.

### මෙතෙකින් වෙෂාග්නිය සැකෙවින් දක්වන ලදු

මොහය නම් දුක්ඛාදි චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි නොදැනීම යයි කියන ලද අවිද්‍යාවයි මෙය ප්‍රකෘති ගින්නක් වැනිය. මොහ නමැති ගින්නෙන්ද චක්ෂුරාදී ධර්මයන් නිතර දූෂිසේ දවනු ලබන්නේය. ඒ චක්ෂුරාදී ධර්මයන් නිත්‍ය වස්තු වශයෙන්ගෙන පවත්නා කල්හි ඇති වන්නාවූ මූඪාවිම චක්ෂුරාදි ධර්මයන්හි වැඩෙන්නාවූ මොහාග්නි යයි දත යුතුයි. මෙකී මොහ ගින්න වූකලී ගින්නක් බැව් සත්වයා නොදන්නේ වීනමුත් ඒ හෙතුවින් තැවීම් දුකට පත්වීම ඒකාන්ත මැයි. විපාක වශයෙන් හෝ නැවෙනු නියත මැයි මොහ ගින්න වනාහි අමොහයද, ඒ හා සමග යෙදූනාවූ සුඛ වෙදනාවද දවා විනාශ කෙරෙයි. අමොහය වනාහි අවදිග්භාගයෙහි යොදූනක් ඇතුළත දිවා රෑ දෙක්හි ඒකාකාර ආලොකමත් කරන්ට සමර්ථවූ මිණි පහණක් හා සමානවූ විශිෂ්ට ප්‍රඥා ධාතුවෙකි. ලෞකික ශාස්ත්‍ර ඉගෙණීම ධාරණය කිරීම් ශ්‍රවණය කිරීම් ආදිය පිණිස උත්සාහ කිරීම ප්‍රඥා නැමැති උයන රෝපනය කිරීමකි.

ඒ අමොහය නම්වූ උයන ක්‍රමයෙන් වර්ධනය වීමෙන් එහි ශ්‍රාවක බොධි ඥාන ප්‍රත්‍යෙක බොධිඥාන සර්වඥාඥාන හා නිර්වාණ නම්වූ

පුෂ්ප ඵල හට ගන්නාහුය. සත්වයෝ අනමතාග්‍ර සංසාරයෙහි රැස් කරණ ලැබුවාවූ අමෝහ සම් උද්‍යාන සියල්ලක් කරණ අවසථාවෙහිම මෝහ ගින්නෙන් දවා විනාශ කරන්නාහුය. මේ වර්තමාන භවයෙහි ලෞකික ලෝකෝත්තර ධර්මයන් ප්‍රගුණ නොකරන්නේ වී නම් මතු භවයන්හි මෝහයනිසා බාල මූල්හ උම්මත්තකයන්ද විය හැක්කේය සුනඛ සිවල් ආදී තිරිසන් යෝනි වලද ඉපදිය හැක්කේය. මේ වනාහි අනමතාග්‍රසංසාරයෙහි රැස්කළාවූ අමෝහ නැමැති උයන් සමූහය මෝහගින්නෙන් දවා විනාශ කරන්නාවූ ආකාරයයි.

අමෝහ නම්වූ උයන වර්ධනය කරගත් තැනැත්තෝ තිරිසන් භව දුකින් මිදෙත්. මනුෂ්‍ය ලෝකයෙහිද බාල අඥාන නමින් පැමිණෙන්නාවූ දුකින් මිදී ශ්‍රාවක බෝධිඥාන ප්‍රත්‍යෙක බෝධිඥාන සබ්බඤ්ඤුත බෝධිඥාන ලබන්නෝය. දූනට පවා බුද්ධ ශාසනය මුනගැසුනේ වී නමුත් ප්‍රඥාව නොමැති හෙයින් සත්වයෝ සතර අපායෙහිම ගමන් කරන්නාහු වෙත්. මේ ආදීන්යේ වශයෙන් සදෙරින්ම නිතර මෝහගින්න ඇවිලෙමින් පවත්නාවූ මේ ත්‍රිවිධ ලෝකයෙහි සැපයක් නම් නැත්තේය. ඒකාන්ත දුක්මය. මෝහය වනාහි අරමුණු මුවාකර දමන ලක්ෂණ ඇත්තේය. අතිශයින් ගැඹුරුවූ අතිශයින් දුරවබෝධවූ චතුසසත්‍යයන්ගේ සවභාව ලක්ෂණ මෝහයෙන් මුළාකරන ලදුව නොදක්න හැකිවී තිබෙත්. කෘෂ්ණ පක්ෂයෙහි තුදුස්වකය, ඝන වන ලැහැබය, මේඝ පටලය, මධ්‍යම රාත්‍රිය යන චතුරාඞ්ගයෙන් යුත් බහලාන්ධකාරයෙන් වැසී ගිය වස්තූන් ඇසට නොපෙණී යන්නාසේ මෝහයෙන් වසා දැමූ අරමුණු හෝ කුශල පක්ෂය හෝ සහජාත චිත්ත චෛතසිකයන් විසින් මැනවයි ඇති සැටි දැකගත නොහැක්කේය. බහලාන්ධකාරයෙන් වැසී ගිය වස්තූන් වව්ලන් මහමූනන්ට පෙණී යන්නාසේ මෝහයෙන් වසා දැමූ අරමුණු හෝ අකුශල පක්ෂය සහජාත චිත්ත චෛතසිකයන්ට මැනවැයි වරදවා වැටහී යන්නේය. මෝහය කුශල පක්ෂයෙහි ජාත්‍යන්ධයෙක් වැනිය. අකුශල පක්ෂයෙහි ඇස් ඇත්තෙක් වැනිය. ඒ බහලාන්ධකාරය පවා ප්‍රකෘති ප්‍රදීපාලෝකයෙන් දුරු කළ හැක්කේය. ප්‍රදීපාලෝකයක් නැතත් අන්ධකාරය පැවතිය හැක්කේ රාත්‍රී කාලයෙහි පමණකි.

සූර්යෝද්ගමනයෙහි සියල්ලම දුරුවී යේ. මෝහ නැමැති බහලාන්ධකාරය වනාහි ආර්ය මාර්ගයට පැමිණෙන තෙක් අනමතාග්‍ර සංසාරය මුළුල්ලෙහි එකවරකුදු දුරුවී ආලෝකවිය කීයා නැත්

තේය. එහෙයින් පෘථග්ජන සත්වයන්ගේ චිත්ත සන්තානය අනමතාග්‍ර සංසාරය මුළුල්ලෙහි එකටම අඳුරුකරගෙන එන මෝහනම ඒකාන්තයෙන් බහලාන්ධකාරයයි කිය යුතු වේ. මෙකී මෝහයට අමෝහය ප්‍රතිපක්ෂය. අමෝහය තෙම කුශල ධර්මයන්හි නොවැඩීමට ප්‍රතිපක්ෂය. තවද අමෝහය තෙම භාවනාමය කුශල ක්‍රියාවට හේතුවෙයි. අමෝහයෙන් යථාස්වභාවය යථාස්වභාව වශයෙන් දරමින් යථාස්වභාවයෙහි පිහිටයි. මූළාවූ තැනැත්තේ සත්‍යය අසත්‍යයයිද, අසත්‍යය සත්‍යයයිද ගනියි. තවද අමෝහයෙන් ඉච්ඡිතාලාභ දුකෙක් නොවෙයි. අමෝහයෙන් මරණ දුකෙක් නොවෙයි. මූළා සහිත මරණය දුක්වේ. මූළා නොවූ තැනැත්තාට සම්මෝහ මරණය නොවේ. එසේම අමෝහයෙන් පෘථග්ජනයන්ගේ සුඛ සංවාසභාවය වෙයි. අමෝහයෙන් තිරිසන් යෝනියෙහි නූපදවයි. මෝහයෙන් නිතර මූළාවී තිරිසන් යෝනියෙහි උපදින්. අමෝහයෙන් අවිහිංසා සංඥාවද ධාතු සංඥාවද වන්නේය. අමෝහයෙන් මධ්‍යම ප්‍රතිපදාවෙහි පිළිපදියි. තවද අමෝහයෙන් සීලබ්බතපරාමාස ඉදං සච්චාභිනිවෙස යන ග්‍රන්ථවය බිඳ පියයි. තවද මෙය දීර්ඝායුෂ්ක බවට ප්‍රත්‍යය වෙයි. මූළා නොවූ තැනැත්තේ හිතාහිත ධර්මයන් දැන අහිත ධර්මයන් දුරු කරමින් හිතවූ ධර්මයන් සේවනය කරමින් දීර්ඝායු ඇත්තේ වේ. තවද අමෝහය තෙම ආත්ම සම්පත්තියට ප්‍රත්‍යය වෙයි. මූළා නොවූ තැනැත්තේ තමහට අභිවෘද්ධියක්ම කරමින් තම ආත්මය සම්පාදනය කෙරෙයි. තවද මෙය ආර්ය විහරණයට ප්‍රත්‍යය වෙයි. අමෝහයෙන් අනාත්ම දර්ශනය වෙයි. මූළා නොවූ තැනැත්තේ යථාස්වභාවය දැකීමෙහි දක්ෂවූයේ පිළිසරණක් නැති ස්කන්ධ පඤ්චකය පිළිසරණක් නොමැති බැව් අවබෝධ කෙරෙයි.

තවද මෝහය තෙම සියලු දුකට, හා සියලු අකුසලයන්ට මුල් වන්නේයයිද සියලු උපද්‍රව ඇති කරන්නේයයිද දුක්ඛ සත්‍යාදී සියලු ධර්මයන් මුවාකොට අඳුරු කරන්නේ යයිද දත යුතුයි. මේ වනාහි සත්ව පුද්ගලයන්ගෙන් විරහිතව චිත්තය ආශ්‍රය කරමින්ද, කිලුටු කරමින්ද පවත්නාවූ ආගන්තුක ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයෙකි

**මෙතෙකින් මෝහාග්නිය සැකෙවින් දක්වන ලදි.**

පූර්ව පූර්ව භවයන්හි රැස්කරනලද කර්මය හේතුකොට ගෙන අළුත් අළුත් භවයන්හි ස්කන්ධයන්ගේ පළමුකොට හට ගැණීම ජාතියයි කියනු ලැබේ. ඒ ජාති තොමෝ සන්තති ජාති ක්ෂණික ජාතියයි දෙවැදෑරුම් වන්නීය. ඔවුනතුරෙන් සන්තති ජාතිය නම්

එක් ඉරියව්වක කලින් කල වෙනස් වෙමින් වරින්වර හටගන්නාවූ ස්කන්ධ පඤ්චකයාගේ නානාප්‍රකාර හටගැනීම්හුයි. එක ඉරියව්වක බොහෝ වේලාවක් ගත කිරීමේදී රුජා කරන්නාවූ රූප හා උෂ්ණ රූපද පහළ වන්නාහුය එකල්හි මේ ස්ථානය රුජා කෙරෙයි. මේ ස්ථානය උණුසුම් යයි දැනීමක් සත්ත්වයන්ට ඇති වන්නේය. නුමුත් අභිනව රූපයන්ගේ පහළවීම යයි කියන ලද ජාති ධර්මය ඔවුන්ට නොවැටහෙන්නේය. එබැවින් මාගේ කකුල රුජා කෙරෙයි. උණුසුම් කෙරේයයි මෙසේ සත්කාය දෘෂ්ටියගේ වශයෙන් ගන්නාහුය. වායෝ ධාතුව හා තේජෝ ධාතුව අධිකව පහළවූ රූප කලාපයන්ට රුජාවයයිද උෂ්ණයයිද ව්‍යවහාර කරනු ලැබේ.

පරමාර්ථ ධර්මයන්හි ප්‍රඥාව ඇත්තෝ ආකාශයෙහි වලාකුළු නැගී එන්නාක්මෙන් උෂ්ණ ධාතුවගේ නැගීමහා ශීත ධාතුවගේ නිරුද්ධවීයාමද දන්නාහුය. එසේ හෙයින් අළුත් රූපයන්ගේ පහළවීමෙන් පරණ රූපයන්ගේ නිරුද්ධවීම ඔවුන්ට ප්‍රකට වේ. ඒ රුජා කිරීම් රූප හා උෂ්ණ රූපයන්ගේ පරම්පරා පහළවීම සන්තති ජාති නම් වේ.

එපරිද්දෙන් අනිකුත් ඉරියව්වලද රූපයන්ගේ පහළවීම හා නිරුද්ධවීම දත යුතුයි. ජ්වර රෝගයෙන් පීඩිතවූ අවස්ථාවෙහි එය වැඩිවීම අඩුවීම ශීතලවීමාදීන්ගේ වශයෙන් ඒ ඒ රූපයන්ගේ ඇතිවෙමින් නැතිවෙමින් පවතිනාකාරය ප්‍රකට වේ. පරම්පරා වශයෙන් එසේ පෙරළෙමින් පවත්නාවූ එක එක රූපයක ඇතිවීම එක එක සන්තති ජාතියයි. මෙසේ නොපෙනෙන තැනැත්තෝ ජීවිතාන්තය දක්වා අභිනව ධර්ම ඇතිවීම පුරාණ ධර්ම නිරුද්ධවීමයයි කියනලද පෙරළීම් ස්වභාවයක් නැත්තේයයි සණ්ඨාන ඡායාමාත්‍රය ගෙන වසන්නේය. ඒ සණ්ඨාන ඡායාව සත්කාය දෘෂ්ටියගේ වාසස්ථානයයි. මේ ලෝකයෙහි ස්කන්ධ පඤ්චකය ඇතිවූයේය. මහත් වූයේයයි ව්‍යවහාර කිරීමක් ඇද්ද එය ජාති ධර්මයටම නමෙකි. දූන් විතර්කයක් ඇතිවිය. ලෝභ සහගත සිතක් ඇතිවිය යනාදීන්ගේ වශයෙන් ලෝකයා ව්‍යවහාර කරන වචන නාම ධර්මයන්ගේ ජාති යයි කියන වචනයෝ වෙත්. සන්තති ජාතිය මෙසේ දත යුතුයි. සත්ත්වයන්ගේ ස්කන්ධකය තේජෝ ධාතු සංඛ්‍යාත වහ්නියෙන් වැළඳ ගන්නා ලද්දකි. සත්ව ශරීරයෙහි එම ගින්න නැත්තාවූ ඉඳි කටු මූනක් පමණකුදු නැත්තේය. එය යම් වස්තුවක් ආශ්‍රය කරමින් පවතීනම් ඒ වස්තුව දවා විනාශකිරීම ඒ ගින්නේ ස්වභාවයයි. එපරිද්දෙන් මේ ශරීරයෙහි සියලු රූපයෝ ස්තබ්ධවූ (තදවූ) පෘථිවි ධාතුව මිශ්‍රයකොට ඇත්තේය. එබැවින් තේජෝ ධාතුවවූ

ගින්න තමා ආශ්‍රය කරණ පෘථිවි ධාතුව නිරතුරුව දවන්නේය. නිශ්‍රය පෘථිවි ධාතුව විනාශවූ කල්හි නිශ්‍රිත තෙජො ධාතු ගින්නද විනාශ වන්නේය. පෘථිවිය ඇසුරුකොට පවත්නාවූ අන්‍ය රූපයෝද විනාශ වන්නාහුය. ප්‍රකෘති ගින්න දෙස පරීක්‍ෂාකාරීව බලන කල එය නිතරම සෙලෙවෙමින් පවත්නා බව පෙනේ. එසේ සෙලවෙනාකාරයෙන් පෙනෙන සියල්ලම පරණ පරණ රූප බිඳෙමින් අළුත් අළුත් රූප පහළවීමය. ඒ සියල්ල ගින්න පිළිබඳ ක්‍ෂණික ජාති, ක්‍ෂණික මරණයෝය. ශරීරයෙහිවූ ගින්නද මෙසේ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා පරණ පරණ ගිනි නිවෙමින් අළුත් අළුත් ගිනි ඇවිලෙමින් පවත්නේය. නිවීමක් පාසා නිශ්‍රය පෘථිවියද විනාශ වන්නේය. පෘථිවි ධාතුවේ විනාශයක් පාසා පෘථිවි ධාතුව නිශ්‍රය කරණ අන්‍ය රූපයන්ගේ විනාශයද වන්නේය. එබැවින් මුලු ශරීරයම ක්‍ෂණයක් පාසා පරණ රූප නිරුඬවෙමින් අළුත් රූප පහළවෙමින් පවත්නේය. මේ ක්‍ෂණයක් පාසා පහළ වන්නාවූ රූපයන්ගේ උත්පාදය ක්‍ෂණික ජාති නම් වේ. ශරීරය පිළිබඳ රූපයන් මෙසේ ක්‍ෂණයක් පාසා උපදිමින් බිඳෙමින් පවත්නා බැවින්

“යථා බුබ්බුලකං පස්සෙ — යථා පස්සෙ මරීචිකං
එවං ලොකං අවෙක්ඛන්තං — මච්චුරාජා න පස්සති”යි

ලොව්තුරු සම්බුදුයන් වහන්සේ විසින් වදාරණ ලදී. ක්‍ෂණික ජාතිය මෙසේ දත යුතුයි.

එක්තිස් තලයකින් යුක්තවූ කාම රූප අරූප සංඛ්‍යාත මේ භවත්‍රය විශාල රඟ මඩලකි. සත්වයෝ වනාහි එහි රැඟුන් දක්වන නළුවෝය. රඟමඩලක වරින්වර නොයෙක් ඇඳුමෙන් සැරසී නොයෙක් වෙස්ගෙන එකම නළුවා නොයෙක් රැඟුම් දක්වන්නාක් මෙන් මේ භවත්‍රය නමැති විශාල රඟමඩලෙහි එකම නළුවා වරින් වර නොයෙක් වෙස්ගෙන රැඟුම් දක්වයි. අද මිනිස්ලොව මිනිස් වෙසින් මිනිස් රැඟුන් දක්වන නළුවා නොබෝකලකින් ඒ වෙශය හැර දෙව් ලොව දෙව්වෙසින් දෙව්ඇඳුමෙන් සැරසී රැඟුන් දක්වයි. නොබෝ කලකින් ඒ වෙශය ඉවත්කොට නරකයෙහි නිරි සතෙකුගේ වෙශයෙන් රැඟුන් දක්වයි. ඒ වෙශයෙන් කලක් සිට නැවත පිසාච වෙශයගෙන රැඟුන් දක්වයි. නැවත එයද ඉවත්කොට තිරිසන් වෙස්ගෙන රැඟුන් දක්වයි. මෙසේ එක එක සත්වයෙක් වරින්වර ගන්නාවූ වෙස්වල ප්‍රමාණයක් නම් නැත. මෙසේ එක් සත්වයෙක් යම්කිසි එක් භවයක එක් වෙශයකින් රැඟුන් දක්වමින්

සිටින කල්හි චුතිචිත්තය පහළවීම වශයෙන් ඒ ඇඳුම මූදලන වගාම ඔහුගේ කර්මය විසින් යවනලද අතික් භවයක පිළිසිඳගැනීම වශයෙන් අතික් වෙශයක් ගෙන රඟ මඬලෙහි පෙනී සිටීන්නේය. මෙසේ භවයකින් චුතවී භවයෙක්හි ඉපදීමයයි කියනලද ජාති ධර්මය සියලුදෙනාටම ප්‍රකටවූවකි. පූර්ව පූර්ව භවයන්හි රැස්කරනු ලැබූ දුශ්චරිත හෙතුකොටගෙනද මේ භවයෙහි රැස්කරනු ලැබූ දුශචරිත හේතුකොටගෙනද මතු භවයෙහි රැස් කරනු ලබන්නාවූ දුශ්චරිත හෙතුකොට ගෙනද බොහෝ දුක්වලින් තැවෙන්නාහුය. මෙසේ ලොකයෙහි වාසය කරන්නාවූ සත්ත්වයන්ට පැමිණෙන්නාවූ සියලු දුක් ජාතිගින්න මුල්කොට ඇති වන්නාහුය. ඒ දුකින් නිදහස් ස්ථානයනම් තෘෂ්ණාක්ෂයකරඥානයට අරමුණුවන්නාවූ අසංඛත ධාතුසංඛ්‍යාත උත්තම නිර්වාණ සැපත වන්නේය.

මෙතෙකින් ජාතිගින්න සැකෙවින් දක්වන ලදී.

පරමාර්ථ නාම රූප ධර්මයන්ගේ පැසීම මිහිකිරීම පරණව මැලවීම දිරා මහළුවීම පිරිහීම ජරා නම් වේ. ලොකයෙහි අතුරුදන්වීම පූර්වභාගයෙහි දිරීමක් නැතිව සිදුවිය හැකි නොවේ. සියලු වස්තූන්ගේම අළුත් පෙන්ගති කැකුළුනාමුල්ගති දිරායාමෙන්ම අතුරුදන්වීම ධර්මතාවයි. පරමාර්ථනාමරූප ධර්මයන්ගේද ඒ අතුරුදන්වීම ජරාපූර්වාඞ්ගමව සිඩවනබව දතයුතුයි. වෘක්ෂ තෘණයෝ කොතන්හි හටගන්නාහු නමුත් ජරාගින්නට ලංවිය නොහෙන හරයක් ඔවුන්ට නැත්තේය. උදෑසන පැවැති වෘක්ෂ තෘණයෝ සවස මෙහෙරීමට පැමිණ අමුතු ස්වභාවයකට පත්වෙති. සවස පැවැති වෘක්ෂ තෘණයෝ උදයෙහි මෝරා විපරීතාකාරයට පැමිණෙන්නාහුය. ඔවුන්ට හටගත් ක්ෂණයෙහි තිබුන ස්වභාවයෙන් නොසිටිය හැක්කාහුය. ඔවුන්ගේ ක්ෂණයක් පාසා මෝරන්නාවූ ස්වභාවයක් හා වැඩී මහත්වන්නාවූ ස්වභාවයක්ද ඇත්තේය. ඒ වෘක්ෂ තෘණයෝ පෘථිවිරස ආපොරසයන්ගේ උපස්ථම්භනයෙන් ක්ෂණයක් පාසා වැඩෙන්නාහුය. ඒ වැඩීම මොහොතක් පාසා අනාගතයෙහි සිදුවනවිට අනාගතයෙහි විනාශය ලංවන්නාවූ ස්වභාවයද ඇතුළත්ව පවත්නේය. ඒ විනාශයට ලංවන ස්වභාවය නම් ක්ෂණයක් පාසා මෝරන්නාවූ පැසෙන්නාවූ ස්වභාවයයි. ඒ මෝරන්නාවූ ස්වභාවය නැතහොත් ක්ෂණයක් පාසා විනාශයට ලංවන ස්වභාවයද නැත්තේය. ඒ විනාශයට ලංවන ස්වභාවය නැති කල්හි විනාශයට පැමිණීමට අවකාශයක්ද නැත්තේය. මැඩුනු කල්හි ඇත්තාවූ වෘක්ෂ තෘණයන්ගේ තද ස්වභාවයද තෙජෝධාතු

සංඛ්‍යාත ගින්නෙන් කරන ලද්දෙකි. ඒ තද ස්වභාවය පවත්නා කාලයෙහිද ක්ෂණයක් පාසා දිරීමට පැමිණෙන ස්වභාවයද ඇත්තේය. කල්පය මුලුල්ලෙහි පවත්නාවූ දඹගසෙහිද ක්ෂණයක්පාසා මෝරන ස්වභාවය ඇත්තේය. හරය අධිකවූ විශාල වෘක්ෂ ජාතිවල හා ඉතා මහත්වන්නාවූ වෘක්ෂයන්හි ඒ දිරන ස්වභාව අප්‍රකටය හරය ස්වල්පවූ වෘක්ෂයන්හි හා සම්පූර්ණයෙන් හරයක් නැත්තාවූ වෘක්ෂයන්හිද ඒ ජරා ස්වභාවය ප්‍රකටව පවත්නේය. මහ පොළොව මහමෙරැදී විශාල වස්තූන්හි ඒ ජරා ස්වභාවය ඇත්තේමය. ඒ සියල්ල කල්ප විනාශයෙහිදී විනාශයට පැමිණෙන්නාහුය. එපරිද්දෙන් මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම රූපස්කන්ධ නාමස්කන්ධ සමූහයෙහිද ජරා නමැති ගින්න ලංකොවිය හැකි හරයක් නම් නැත්තේය. ඒ ස්කන්ධ සමූහය ප්‍රතිසන්ධියෙහි පටන්ම ජරා ගින්න විසින් නිරන්තර තවනු ලබමින් පවත්නේය. ජරා ගින්න ප්‍රකටවීම පිණිස විස්තර කර දක්වන්නෙමි. මනුෂ්‍යයන්ගේ පරමායුෂ අඩුවැඩි කිරීම ජරාවගේ කෘත්‍යයකි. ආදිකල්පිකයන්ගේ ස්කන්ධයෝ බොහෝ සාරවත්යහ. ඒ ස්කන්ධයෝ ප්‍රතිසන්ධියෙහි පටන් වර්ෂ අසංඛ්‍යයක් මුළුල්ලෙහි ජරා ගින්නෙන් දවන දූවීම ඉසිලීමට සමර්ථයහ. ආදිකල්පිකයෙකුගේ ශරීරයක් වර්ෂ අසංඛ්‍යයකින් මිස ජරා ගින්නට ගොදුරු නොවේ. එබැවින් එකල පරමායුෂය වර්ෂ අසංඛ්‍යයක් විය. ඉන්පසු ක්‍රමයෙන් බ්‍රහ්ම විහාර ධර්මයන් හීනවෙන්ට යන්නේය. එබැවින් මනුෂ්‍ය ස්කන්ධයේ සාරයද ක්‍රමයෙන් පිරිහී යන්නේය. ඒ හේතුවෙන් පරමායුෂයත් ක්‍රමයෙන් පිරිහිණ. මෙසේ පිරිහී ඇවිත් අද අසූවස මනුෂ්‍යයන්ගේ පරමායුෂ වී තිබේ.

වර්තමාන මනුෂ්‍යයෙකුගේ ශරීරයත් අසූ වසක් තුළදී ජරාගින්නට භස්ම කළ හැකිවේ. මනුෂ්‍යයන්ගේ ආයුෂය පිරිහී පරමායුෂය දස අවුරුද්දක් වූ කල්හි එවකට සිටින්නවුන්ගේ ස්කන්ධය පිදුරු අඹරා කළ රූපයක්මෙන් අතිශයින්ම ඕජමෙන් හීනවූවක් වේ. ජරා ගින්නට ඒ ශරීරයත් දසවසකින් ඉතා පහසුවෙන් භස්ම කළහැකිවේ. නැවත මනුෂ්‍යයන්ගේ බ්‍රහ්මවිහාරධර්මයන් වැඩීමෙන් ක්‍රමයෙන් ආයුෂයද වැඩිවී ගොස් අසංඛ්‍යයට පරමායුෂය වන්නේය තිරශ්චීන සත්ත්වයන් කෙරෙහිද වෙන් වෙන් වශයෙන් ආයුෂය ඇත්තේත් ජරා ගින්න නිසාය. චාතුර්මහාරාජික දිව්‍ය රාජයන්ට ඔවුන්ගේ අවුරුදු ගණනින් අවුරුදු 500ක් ආයුෂය ඇත්තේය. තව්තිසා දිව්‍ය ලොකයට ඔවුන්ගේ ගණනින් අවුරුදු 1000 ක් ආයුෂ ඇත්තේය. මේ ආදින්ගේ වශයෙන් දිව්‍යලොක බ්‍රහ්මලොකයන්හිද ආයුෂය වෙනවෙනම ඇත්තේත් ජරා ගින්න නිසාය. ආයුෂය

නියම නැති භූම්‍යස්ථ දෙවියන්ගේ සහ නෛරයික ප්‍රේතාදී අසුරයන්ගේද ආයුෂය පිළිබඳව කර්මය ප්‍රධාන වේ. ඒ කර්මයට සුදුසු පරිද්දෙන් ජරා ගින්න ස්කන්ධ පඤ්චකය ද හළු කරන්නේය. අචේතනිකවූ වෘක්ෂ ලතාදියටද ජරා ගින්න ඇතිසෙයින්ම වෙන් වෙන් වශයෙන් ආයුෂය ඇති වන්නේය. ප්‍රථම වයස මධ්‍යම වයස පශ්චිම වයස යන මොවුන්ගේ වශයෙන් ආයුෂය පිරි සිඳීමද මන්ද දසක ඛිඩ්ඩා දසක යනාදීන්ගේ වශයෙන් පිරිසිඳීමද මේ ජරාගින්න හෙතුකොට වන්නේය ජරා ධර්මය සත්කාය දෘෂ්ටියෙන් වසා තිබෙන හෙයින් පෘථග්ජන සත්වයන්ට අදෘශ්‍යමාන වෙයි. තමුන් සත්වයන්ට මම වෘද්ධවීමියි පෙනීමක් ඇත්තේය. ඒ ජරාවද වයෝවෘද්ධ ජරා සන්තති ජරා ක්ෂණික ජරායයි ත්‍රිවිධ වේ. ඔවුනතුරෙන් හිසකේ සුදුවීම් දත් වැටීම් ඇඟ රැලිවැටීම් ආදිය නිසා පෙනෙන ජරාව වයෝවෘද්ධ ජරා නම්. සන්තති ජරාව සන්තති ජාතියට දක්වූ පරිදි නාම රූපයන්ගේ වෙනස්වීමයි. ක්ෂණික ජරාව නම් නාම රූපයන්ගේ ක්ෂණ ක්ෂණයෙක්හි දිරීමයි. තවද සවීචිජරා අවීචි ජරා යන මොවුන්ගේ වශයෙන් ද්විවිධ වේ.

මෙතෙකින් ජරා ගින්න සැකෙවින් දක්වන ලදී.

පරමාර්ථ නාම රූප ධර්මයන්ගේ අතුරුදන් වීම විනාශවීම මරණ නම් වේ. ඒ මරණයද සම්මුති මරණය, සන්තති මරණය ක්ෂණික මරණයයි ත්‍රිවිධ වේ. ඔවුනතුරෙන් සම්මුති මරණය ආයුෂ ක්ෂයවීමෙන් සිදුවන්නාවූ මරණය කර්මය ක්ෂයවීමෙන් සිදුවන්නාවූ මරණය ආයු කර්ම දෙදෙනාගේ ක්ෂය වීමෙන් සිදුවන්නාවූ මරණය කඩු ආදියෙන් සිදුවන්නාවූ උපච්ඡේදක මරණයයි සිව්වැදෑරුම් වේ මෙසේ සතරාකාර මරණයන් අතුරෙන් දහසක් හවුරුද්දට ආයුෂ ඇති කර්මයෙකින් උපන් සත්ව තෙම දහසක් හවුරුද්ද ගෙවීමෙන් වන්නාවූ මරණය ආයුක්ඛය මරණ නම් වේ. දහසක් හවුරුද්දට ආයුෂ ඇති කාලයෙක්හි පන්සියයක් හවුරුදු විපාකදිය යුතුවූ කර්මයකින් ඉපිද ඒ කර්ම වේගය සිඳීයාමෙන් පන්සියයක් හවුරුද්දෙන් වන්නාවූ මරණය කර්ම ක්ෂය මරණ නම් වේ. අසූ හවුරුද්දකට ආයුෂ ඇති කාලයෙහි අසූ හවුරුද්දම විපාක දිය හැකි කර්මයකින් ඉපිද අසූ හවුරුද්දෙන් මියයාම ආයුකර්ම දෙදෙනාගෙන් වන්නාවූ මරණයයි. අසූ හවුරුද්දක් ආයුෂ ඇති කාලයෙක්හි අසූ හවුරුද්දක් විපාක දියහැකි කර්මයකින් උපන් සත්වතෙම සතළිස් හවුරුදු කාලයෙහි යුද්ධයකට හසුවීමෙන් හෝ වෘක්ෂයකින් වැටීමෙන් හෝ දියෙහි වැටීමෙන් හෝ විෂ භක්ෂණයකින් හෝ වන්නාවූ මරණය උපච්ඡේදක මරණය නම් වේ.

සන්තති මරණයද නාම සන්තති මරණ රූප සන්තති මරණ වශයෙන් දෙවැදෑරුම් වේ. ඔවුනතුරෙන් සකන්ධ පඤ්චකය තුල පහළවන්නාවූ නාම ධර්මයන්ගේ විනාශවීම නාම සන්තති මරණ නම්වේ. හෙද චක්ඛුසයෙහි පෙණෙන්නාවූ ධාතූන්ගේ නිරුද්ධවීයෑම ශ්‍රොතයෙහි ශ්‍රවණය කරන්නාවූ ධාතූන්ගේ නිරුද්ධවීයෑම ඝ්‍රාණයෙහි ආඝ්‍රාණය කරන්නාවූ ධාතූන්ගේ නිරුද්ධවීයෑම ජිව්හා ප්‍රසාදයෙහි රස දැනගන්නාවූ ධාතූන්ගේ නිරුද්ධවීයෑම කාය ප්‍රසාදයෙහි ස්පර්ශය දැනගන්නාවූ ධාතූන්ගේ නිරුද්ධවීයෑම මනොද්වාරයෙහි චින්තනය කරන්නාවූ ධාතූන්ගේ නිරුද්ධවීයෑම යයි සවැදෑරුම් වේ. තවද ස්පර්ශ වෙදනායතන ආදිවූ නාම ධර්මයන්ගේ වශයෙන් බහු ප්‍රභෙද වෙත්.

ඊට උදාහරණ කවරේද යත්? ගින්නෙන් පැසෙන දිය බඳුනෙහි දිය බුබුල් නගිමින් පවත්නාහුය. උෂ්ණ තෙජො ධාතුව නිරුද්ධවූ කල්හි ඒ දියබුබුල්ද නිරුද්ධවී ජලය ප්‍රකෘති ස්වභාවයට පැමිණෙන්නේය. නැවත උෂ්ණ තෙජො ධාතුව ලැබුනේනම් දිය බුබුල්ද හටගන්නාහුය. උෂ්ණ තෙජො ධාතුව පහවූයේනම් දිය බුබුල්ද පහවන්නාහුය. මේ උපමාවෙහි දිය බුබුල් නිරුද්ධවීම ධාතූන්ගේ නිරුද්ධවීම මෙනි. ලොභාරම්මණයක් හමුවූ කල්හි මනොද්වාරයෙහි ලොභධාතුනම් වූ දියබුබුල් පහළවන්නාහුය. ආරම්මණය පහව ගිය කල්හි ලොභධාතු සියල්ලක්ම නිරුද්ධවන්නාහුය. නැවත ආරම්මණය හමුවූයේනම් ලොභ නැමැති දියබුබුල් මනොද්වාරයෙහි පහළවන්නාහුය. නැවත පහවී ගියේනම් ලොභ නැමැති දියබුබුල්ද නිරුද්ධ වන්නාහුය. මේ නිරුද්ධවීම ධාතූන්ගේ මරණය නම් වේ. චක්ඛුඃප්‍රසාදයෙහි රූපාරම්මණයන්ගේ ඝට්ටණයෙන් චක්ඛුර්විඥානය සමග නාමනම්වූ දියබුබුල් පහළවන්නාහුය. එය පහළවීම සන්තති ජාති නම්වේ. නිරුද්ධවීම සන්තතිමරණ නම්වේ. මෙහි චක්ඛුඃප්‍රසාදය ජලය හා සදෘශවෙ. ඒ ඒ වර්ණසංස්ථානයන් ගිනි දැල්වීම හා සදෘශවේ. දියබුබුල් පහළවීම නාමධර්මයන්ගේ පහළවීම හා සදෘශ වේ. දියබුබුල් නිරුද්ධවීම චක්ඛුර්විඥානය සමග පහළවූ නාමධර්මයන්ගේ නිරුද්ධවීම හා සදෘශවේ. නාමසන්තති මරණය මෙසේදතයුතුයි. ගමන් ක්‍රියාවෙහි පියවරක් පියවරක් පාසා ඉස්සීමෙහි හටගත්තාවූ වායොධාතුව තැබීමෙහි නිරුද්ධවෙයි. තැබීමෙහි හටගත්තාවූ වායොධාතුව ඉස්සීමෙහිදී නිරුද්ධවන්නේය. එපරිද්දෙන් නිරුද්ධවීම දැකීමට බොහෝ දුෂ්කර වූයේ නමුදු යොගාවචරයාගේ ත්‍රිහෙතුක ඥානයෙන් දැකීමට දුෂ්කර නොවේ. පාෂාණයකින් පාෂාණයකට ගැසූ කල්හි ගින්දර නික්මී නිරුද්ධවන්නාක්මෙන් පය ඉහලට ඉස්සීමෙහි හටගන්නාවූ වායොධාතුව පය භූමියෙහි තැබීමෙහිදී නිරුද්ධ වන්නේය. එපරිද්දෙන් අනික් රූපයන්ගේද සන්තති මරණය දත යුතු.

ක්‍ෂණික මරණයද නාමයන්ගේ ක්‍ෂණික මරණය රූපයන්ගේ ක්‍ෂණික මරණයයි විප්‍රභෙද වේ. ඔවුනතුරෙන් නාමයන්ගේ ක්‍ෂණික මරණයද චක්‍ෂුර්විඥානය ප්‍රමුඛකොට ඇති නාමයන්ගේ ක්‍ෂණික මරණය ශ්‍රොත්‍ර විඥානය ප්‍රමුඛකොට ඇති ශබ්ද ශ්‍රවණය කරන්නාවූ නාමයන්ගේ ක්‍ෂණික මරණය, ඝ්‍රාණවිඥානය ප්‍රමුඛකොට ඇති ගඳ සුවඳ ආඝ්‍රාණය කරන්නාවූ නාමයන්ගේ ක්‍ෂණික මරණය, ජිහ්වා විඥානය ප්‍රමුඛකොට ඇති රසය විඳින්නාවූ නාමයන්ගේ ක්‍ෂණික මරණය, කාය විඥානය ප්‍රමුඛකොට ඇති ස්පර්ශය විඳින්නාවූ නාමයන්ගේ ක්‍ෂණික මරණය, මනොවිඥානය ප්‍රමුඛකොට ඇති නාමයන්ගේ ක්‍ෂණික මරණයයි සවැදෑරුම් වේ.

ස්පර්ශයාගේ මරණය, වෙදනාවගේ මරණය, ලොභයාගේ මරණය, ද්වෙෂයාගේ මරණය, ශ්‍රද්ධාවගේ මරණය, ප්‍රඥාවගේ මරණය යනාදීන්ගේ වශයෙන් බොහෝ වෙත්. එක විථියකගේ මරණය සන්තති මරණ නම්. ප්‍රථම ජවනය, ද්විතීය ජවනය යනාදීන්ගේ වශයෙන් පැවති මරණය ක්‍ෂණික මරණ නම්. මේ සකන්ධය ඇඟුලත පිටත දවසක් මුළුල්ලෙහි පහළවන්නාවූ චිත්තයන්ගේ නිරොධය නම්වූ ක්‍ෂණික මරණයද ඵස්සවෙදනාදි චෛතසිකයන්ගේ නිරොධය නම්වූ ක්‍ෂණික මරණයදැයි මොවුන්ගේ වශයෙන් නාම ධාතූන්ගේ ක්‍ෂණික මරණය දතයුතු. රූපයන්ගේ ක්‍ෂණික මරණය වනාහි තද මෘදු ස්වභාවයෙන් යුක්තවූ පෘථිවි ධාතුවගේ ක්‍ෂණික මරණයද ආබන්ධන ලක්‍ෂණ හා පග්ඝරණ ලක්‍ෂණයෙන් යුක්තවූ ආපොධාතුවගේ ක්‍ෂණික මරණයද ශීතොෂ්ණ ලක්‍ෂණවූ තෙජො ධාතුවගේ ක්‍ෂණික මරණයද, සමුදීරණ ලක්‍ෂණවූ වායො ධාතුවගේ ක්‍ෂණික මරණයද ඒ සතර මහා ධාතූන් නිශ්‍රය කරගෙණ පවත්නාවූ චක්‍ෂුඃප්‍රසාදයාගේ ක්‍ෂණික මරණයද, ශ්‍රොත ප්‍රසාදයාගේ ක්‍ෂණික මරණයදැයි යන ආදීන්ගේ වශයෙන් බොහෝ ප්‍රභෙද වෙත්. ක්‍ෂණික ජාති, ක්‍ෂණික ජරාවන් දක්වනු ලැබූවාවූ ක්‍රමයෙන් මේ ක්‍ෂණික මරණයද දත යුතුයි. සත්ව පුද්ගල යනාදීන්ගේ වශයෙන් ගන්නාවූ සණ්ඨානය බැහැරකොට සකන්ධ පඤ්චකයෙහි තිබෙන්නාවූ තද මෘදු ශීතොෂ්ණ යනාදීන්ගේ වශයෙන් පවත්නාවූ හුදකලාවූ ධාතු ස්වභාව නම්වූ පරමාර්ථ ස්වභාව පෙණෙන කල්හිම ඒ ධාතූන්ගේ ක්‍ෂණික මරණය පෙණෙන්නේය. ක්‍ෂණික ජාති, ක්‍ෂණික ජරා, ක්‍ෂණික මරණ ධර්ම බැලීමට බොහෝ දුෂ්කර වෙත්. සන්තති ජාති, සන්තති ජරා, සන්තති මරණයන් පෙණෙන කල්හිම විදර්ශනා සම්‍යක් දෘෂ්ටිය ඇති වන්නේය. එසේ ඇතිවූ කල්හි සත්කාය දෘෂ්ටි නිරය ගින්න නිවා ලිය හැක්කේය. නිර්වාණය වනාහි යෙකී සම්මුති සන්තති ක්‍ෂණික මරණ ධර්ම කිසිත්

නැත්තේමය. අමෘත ස්වභාවයෙන් යුත් නිවනට පැමිණෙන තුරු සියලු සත්ත්වයෝ මරණ භයින් ව්‍යාකුල සිත් ඇත්තාහුය. එසේම දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය ජීවිත සියල්ලක්ම මරණයෙන් කෙළවර වන සුළුය. එබැවින් මරණ ගින්න හා සමාන භයක්ද, වීපතක්ද, සං- වෙග විය යුතු කාරණයක්ද තවත් නොමැතිසි.

මෙතෙකින් මරණාග්නිය සැකෙවින් දක්වන ලදී.

ඥාති ව්‍යශන, රොග ව්‍යශන, භොග ව්‍යශනාදිවූ ඒ ඒ දුක්ඛ ධර්මයෙන් පොපියවන්නාවූ අඥබාල ජනයාහට සොක, පරිදෙව, දුක්ඛ, දොම්නස්ස, උපායාස යන ධර්මයෝ පහළ වෙත්. එයින් සොකය යනු කවරේද?

ඥාති ව්‍යසනාදියෙන් මඩනා ලද්දහුගේ ශොකකිරීම් ආකාරයෙන් පැවැත්තාවූ දොම්නස් වෙදනාව ශොක නම් වෙයි.

“තත්ථ කතමො සොකො? ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං අයං වුච්චති සොකො” යනුවෙන් වදාරන ලදී

ඔවුන් අතුරෙන් ශොකය යනු කවරේදයත්? පුත්‍ර දුහිත්‍රාදී ඥාති ව්‍යශනයෙන් ස්පර්ශීවූවහුගේද, භොගව්‍යසනයෙන් ස්පර්ශීවූවහුගේද, රොගව්‍යශනයෙන් ස්පර්ශීවූවහුගේද, ශීලව්‍යශනයෙන් ස්පර්ශීවූවහුගේද, දෘෂ්ටිව්‍යශනයෙන් ස්පර්ශීවූවහුගේද වුක්තව්‍යශනාවශිෂ්ට එක්තරා එක්තරා ව්‍යශනයකින් සමන්විතවූවහුගේද එක්තරා එක්තරා දුඃඛ ධර්මයකින් ස්පර්ශීවූවහුගේද ශොකයෙක් ශොක කිරීම් ආකාරයක්, ශොක කිරීම් ස්වභාවයක් ඇද්ද ඇතුළත තැවීමෙක් ඇතුළත හාත්පස තැවීමෙක් ඇද්ද චිත්තයාගේ හාත්පස දැවීමෙක් දොම්නසක් ශොක නැමැති හුලක් ඇද්ද මේ ස්වභාවය ශොකයයි කියනු ලැබේ. ඒ ශොකය උපදීනුවර් ගින්නක් මෙන් සිත දවයි. තවයි. මාගේ සිත දවන ලද්දේය.

ඔට කිසිවක් වැටහෙන්නේ නැතැයි කියයි. ඒ ශොකය තෙම අර්ථ වශයෙන් දොම්නස මැයි. එසේදවුව ශොකය තෙම දැවීම ලක්‍ෂණකොට ඇත්තේය. චිත්තයාගේ හාත්පස දැවිලිකිරීම කෘත්‍යකොට ඇත්තේය. නැවත නැවත ශොචනය ඥානයට වැටහීම් කොට ඇත්තේය. මේ ශොකය ස්වභාවයෙන් දුක් බැවින් හා දුකට කාරණුවූ බැවින් දුකයයි වදාරණලදී. කිනම් දුකකට කාරණු

වන්නේද යත්? කායික දුඃඛයටද ජවන ක්ෂණයෙහි දෞර්මනස්‍ය දුඃඛයටද කාරණු වේ. ඒ එසේ මැයි ශෝකය බලවත්වීමෙන් හෘදයෙහි මහත් හඩක් ගවගෙන පැසීමට පැමිණ පිපිරෙයි.

මුඛයෙන් කාලවර්ණවත් ලෝහිත ධාතුව නික්මෙයි. එකල බලවත් කාය දුඃඛයක් උපදී. මාගේ මෙතෙක් ඥාතීහු අනයව්‍යසනයට පැමිණියෝය. මෙතෙක් වස්තු විනාශප්‍රාප්තවූ වාහුයයි මෙසේ සිතන්නාහුටද බලවත් දෞර්මනස් උපදී. මෙසේ මේ විවිධවූ දුඃඛයන්ට කාරණුවූ හෙයින් ශෝකය තොම දූතයයි දතයුතුයි.

ශෝක ගින්න වනාහි පස්වැදෑරුම් වේ. ඒ කෙසේද යත්? පුත්‍ර දුහිතෘ සහෝදර ඥාති සමූහයාගේ සම්පූර්ණත්වය දැක ඇති වන්නාවූ සෞම්නස්‍ය හා ප්‍රීතිය ද විනාශ කිරීමට සමර්ථවූ එක් ශෝක නමැති ගින්නක්ද, ධන භෝග සමෘද්ධිය දැක හටගන්නාවූ සෞම්නස හා ප්‍රීතිය ද විනාශකරන්නාවූ එක් ශෝක නැමැති ගින්නක්ද රෝග භය දුරුවීමෙන් මනුෂ්‍යයන්ට පහළ වන්නාවූ සෞම්නස හා ප්‍රීතිය ද විනාශ කරන්නාවූ එක් ශෝක නැමැති ගින්නක්ද, යහපත් ප්‍රකෘති ස්වභාව හෙතුකොටගෙණ මනුෂ්‍යයන්ට ඇතිවන්නාවූ සන්තුෂ්ටි භාවය ද විනාශ කරන්නාවූ එක් ශෝක නැමැති ගින්නක්ද දෘෂ්ටිය පිරිසිදුවීමෙන් ඇතිවන්නාවූ සතුට ද විනාශකරන්නාවූ එක් ශෝක නැමැති ගින්නක්ද මෙයින් අන්‍යවූ භ කා ප්‍රකාර ප්‍රීති සෞම්නස් ද විනාශකර ලීමට සමර්ථවූ ශෝක නැමැති ගින්නක් දැයි මෙසේ ශෝක ගින්න පස්වැදෑරුම් වේ. අනමතාග්‍ර සංසාරයෙහි යහපත් පුත්‍ර දුහිතෘ ආදි ඥාති සමූහයාගේ සම්පූර්ණවීම යයි කියන ලද ඥාති සම්පත්ති අනන්ත අප්‍රමාණයහ. ඒ අනන්ත අප්‍රමාණ ඥාති සම්පත්ති සියල්ලක් ඥාතිවිපත්ති නම්වූ සුසාන භූමියට පැමිණ කෙළවර වන්නාහුය. හෙවත් ඥාතිවිපත්ති ගින්නෙන්ද විනාශවීමෙන් කෙළවර වන්නාහුය. ධන භෝග සම්පත්ති සියල්ලක් භෝග විපත්ති සුසාන භූමියට පැමිණීමෙන් කෙළවර වන්නාහුය. ආරෝග්‍ය සම්පත්ති සියල්ලක් රෝග විපත්ති නම්වූද සීල සම්පත්ති සියල්ලක් සීල විපත්ති නම්වූද ලෞකිය සම්මාදිට්ඨි සියල්ලක් දිට්ඨි විපත්ති නම්වූද, සුසාන භූමින්ට පැමිණීමෙන් කෙළවර වන්නාහුය ඒ ඒ සියලු විපත්ති ඒකාන්ත දුක්මය එසේ හෙයින් ඥාති සම්පත්තියෙන් සම්පූර්ණවූ තැනැත්තෝ ඥාතිවිපත්තික නම්වූ ගින්න නිතරම ශීර්ෂයෙහි තබාගෙණ වාසය කරත්. එසේම ධන භෝග සම්පත්ති ආදියෙන්ද සම්පූර්ණවූ තැනැත්තෝ ඒ ඒ විපත්ති නම්වූ ගින්න ශීර්ෂයෙහි තබාගෙණ වාසය කරත්.

මෙසේ විපත්ති ගින්න ශීර්ෂයෙහි තබාගෙණ වාසයකරන්නාවූ මනුෂ්‍ය භව දිව්‍ය භවයන්හි කවර සැපයක් ඇත්තේද? නැත්තේමැයි.

මෙකී ශෝකාග්නිය ප්‍රියවූ වස්තූන් නිසා පහළ වේ. ප්‍රියවූ වස්තු නැති කල පහළ නොවේ. පහවූ ශෝක ඇති පුද්ගලයන්ට ලෝකයෙහි කිසිවක් කෙරෙහි ප්‍රිය භාවයක් නැත්තේය. එහෙයින් ඒ සත්වයෝ සුවපත්වූ පහවූ ශෝක ඇත්තෝ වෙති. මේ වනාහි ප්‍රියවූවන් කෙරෙහි චිත්ත සන්තාපය කාරණාවූද පරිදේවාග්නියට ආසන්න කාරණාවූද ධර්මයෙකි. ශෝකයට යටත් නොවන එනම් ස්වභාවය නිවන වේ. ශෝක ජනක හෙතු කිසිවක් නිවනෙහි නැත.

මෙතෙකින් ශෝකාග්නිය සැකෙවින් දක්වන ලදී.

ඥාති මිත්‍ර අඹුදරු ආදීන්ගේ විනාශයෙහි ඇඬීම් ආකාරයෙන් පවත්නාවූ අනිෂ්ටවූ චිත්තජ ශබ්දය පරිදේව නම් වේ

''තත්ථ කතමො පරිදෙවො? ඤාතිව්‍යසනෙනවා ඵුට්ඨස්ස භොග ව්‍යසනෙනවා ඵුට්ඨස්ස රොගව්‍යසනෙනවා ඵුට්ඨස්ස සීලව්‍යසනෙනවා ඵුට්ඨස්ස දිට්ඨිව්‍යසනෙනවා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙනවා, සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ ධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා ලාලප්පිතත්තං අයං වුච්චති පරිදෙවො.

මෙහි ලුහුඬු අදහස මෙසේයි. ඔවුන් අතුරෙන් පරිදේව යනු කවරේදයත්? ඥාතිව්‍යසනාදි එක්තරා එක්තරා ව්‍යසනයකින් සමන්විතවූවහුගේද එක්තරා එක්තරා දුඃඛ ධර්මයකින් ස්පර්ශවූවහුගේද ඒ ඒ අය ඒ ඒ වස්තු උදෙසා හැඬීමෙක් ඒ ඒ අය ඒ ඒ වස්තු කීර්තනය කොට හැඬීමෙක් ඒ ඒ අය ඒ ඒ වස්තු උදෙසා හඬන බවක් ඒ ඒ අය ඒ ඒ වස්තු කීර්තනයකොට හඬන බවක් ඇද්ද ඒ ඒ වචන බෙණෙමින් වැලපීමෙක් නොයෙක් අයුරින් වැලපීමෙක් නැවත නැවත වැලපෙන ආකාරයක් නැවත නැවත වැලපීම් බවක් ඇද්ද මේ ස්වභාවය පරිදේවයයි කියනු ලැබේ. අනමතග්‍ර සංසාරයෙහි සත්වයන්ට ඇතිවන්නාවූ සිතාසිම් සියල්ල පරිදේව ගින්න යයි කියන ලද සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහ.

මෙතෙකින් පරිදේවාග්නිය සැකෙවින් කියනලදී.

කයට රිදීම් ආකාරයෙන් පැවැත්තාවූ දුක්ඛ වෙදනාව දුක්ඛ නම් වෙයි. වදාරන ලද මැයි-

තත්ථ කතමං දුක්ඛං? යං කායිකං අසාතං කායිකං දුක්ඛං කාය සම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා ඉදං වුච්චති දුක්ඛං"

ඔවුන් අතුරෙන් දුක යනු කවරේද යත්? කායිකවූ හෙවත් කාය ප්‍රසාදය නිශ්‍රය කොට ඇත්තාවූ යම් නොසැපෙක් ඇද්ද කායිකවූ යම් දුකෙක් ඇද්ද කාය ස්පර්ශයෙන් හටගන්නාවූ නොසැපවූ දුක්වූ යම් විඳීමක් ඇද්ද මේ ස්වභාව දුකයයි කියනු ලැබේ. අත් පා කන් නාසා ආදි ශරීරාවයවයන් කැපීම් දුකින් දුකට පත්වූ සත්ත්වයාට කායිකවූ දුක්ඛ වේදනාව උපදී. මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් අත් පා කන් නාසා ආදී ශරීරාවයවයන් කපනු ලැබීමෙන් බලවත් දුක් විඳිත්. වණ පිළිකා හටගැනීමෙන්ද, ගල් මුල් පොලු මුගුරු වැදීමෙන්ද, කටු උල් ආදිය ඇනීමෙන්ද, සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස් හා පොළොන් ආදී දරුණු සතුන් විසින් කනු ලැබීමෙන්ද රාජ දණ්ඩන වශයෙන් මුගුරුවලින් තලනු ලැබීම කසෙන් තලනු ලැබීමාදි අනන්ත වධ බන්ධන පීඩා ලැබීම හේතුකොට ගෙන හට ගන්නා කායික දුක්ඛ වේදනාවෝ අනන්ත අප්‍රමාණයහ. මෙය දෞර්මනසට ආසන්න කාරණායි. සියලු කායික සුඛ වේදනාවෝ කායික දුක්ඛ ගින්නයයි කියන ලද සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය.

මෙතෙකින් දුක්ඛ ගින්න සැකෙවින් දක්වන ලදී.

සිතට රිදීම් ආකාරයෙන් හටගත් දුක්ඛ වේදනාව දෞර්මනස්ස නම් වෙයි වදාරන ලද මැයි.

තත්ථ කතමං දොමනස්සං? යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතො සම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතො සම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා ඉදං වුච්චති දොමනස්සං"

ඔවුනතුරෙන් දොම්නස යනු කවරේද යත්? චෛතසිකවූ යම් නොසැපෙක් චෛතසිකවූ යම් දුකෙක් ඇද්ද භවාඞ්ග චිත්ත ස්පර්ශයෙන් හටගන්නාවූ නොසැපවූ දුක්වූ යම් විඳීමක් භවාඞ්ග චිත්ත ස්පර්ශයෙහි හටගන්නාවූ නොසැපවූ දුක්වූ යම් වේදනාවක් ඇද්ද මේ ස්වභාව දොම්නසයයි කියනු ලැබේ. ඒ දොම්නස් තෙම අනිටු අරමුණු අනුභව කිරීම ලක්ෂණ කොට ඇත්තේය. ඇති සැටි හෝ වරදවා අනිටු ආකාරයෙන් අරමුණු අනුභව කිරීම කෘත්‍ය කොට ඇත්තේය. සිත්හි හටගන්නාවූ ආබාධ ඥානයට වැටහීම කොට ඇත්තේය. දොම්නස ඒකාන්තයෙන් කාම ධාතුවෙහි උපදනා හෙයින් හෘදය වස්තුව ආසන්න කාරණකොට ඇත්තේය

දෞර්මනස්සය නම් සිත තුළම හටගන්නා ස්වභාවයෙකි. කයට වධ බන්ධන පීඩා ලැබීම නිසා කායික දුක්ඛ නම් ගින්න හටගන්නාක් මෙන් සිතට පීඩා ලැබීම නිසා දෞර්මනස්ස නම් ගින්න හටගන්නා බව දත යුතුයි. මේ දෞර්මනස්ස බොහෝ සේම ක්‍රෝධ සහගතවද ඊර්ෂ්‍යා සහගතවද හටගන්නේය. නොයෙක් වර්ණයෙන් රඳනා ලද වස්ත්‍රාභරණාලංකාරයෙන් සැරසී ගමනා ගමනය කරන්නවුන් දුන එබඳු යසඉසුරක් තමන්ට නොමැති හෙයින් සිතතුළ දෞර්මනස්ස හට ගණී. තමාට නැතත් ඇති අයගේ එබඳු ඉසුරු බර දුන සමහරු ඊර්ෂ්‍යා වශයෙන්ද සමහරු ක්‍රෝධ වශයෙන්ද සිතා තමාට එබඳු සම්පත් නැතිබැව් සලකා සිත පීඩාවට පත්කරන්නේය. නොසතුටු ආකාරයක් පහළ කරන්නේය. චෛතසික දුක්ඛ වේදනාවෙන් පීඩිතවූ සත්වයෝ හිසකේ විසුරුවා හඬති. ඔව්හු අභිමුඛව ඇද වැටෙත්. ප්‍රපාතයට පනිත්. ආයුධ ගනිති. ගින්නට ප්‍රවිෂ්ටවෙති ඒ ඒ විපරීත ආකාරයෙන් විපිළිසරසිත් ඇති ජනයෝ කාත්පස දුවෙන සිත් ඇත්තෝ ඒ ඒ විපරීත වස්තුව සිතති. මේ වනාහි උපායාසයට ආසන්න කාරණයි. සතුටුවීම් සියල්ල දෞර්මනස්ස නම් සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහ.

මෙතෙකින් දෞර්මනස්ස ගින්න සැකෙවින් දක්වන ලදී.

ඥාති ව්‍යසනාදීන් නිමිති කොට බලවත් ක්ලාන්ත භාවයෙන් විරූපවූ චිත්තයාගේ පැවැත්ම උපායාස නම් වෙයි. මේ කාරණය වදාරණ සර්වඥයන් වහන්සේ

"තත්ථ කතමො උපායාසො? ඤාතිබ්‍යසනෙනවා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙනවා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙනවා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ ධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං අයං වුච්චති උපායාසො" යනු වදාළසේක.

ඔවුනතුරෙන් උපායාස යනු කවරේද යත්? ඥාතිව්‍යසනාදී එක්තරා එක්තරා ව්‍යසනයකින් සමන්විතවූවහුගේද එක්තරා එක්තරා දුඃඛ ධර්මයකින් ස්පර්ශවූවහුගේද දැඩිසේ වෙහෙසීමෙක් ඉකිබිඳිමින් වෙහෙසීමෙක් ඇද්ද දැඩිසේ වෙහෙසෙන ස්වභාවයක් ඉකිබිඳිමින් වෙහෙසෙන බවක් ඇද්ද මේ ස්වභාවය උපායාසයයි කියනු ලැබේ. අධිකව සතුටුවීම් සියල්ල උපායාස සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහ. මේ වනාහි සිත තුළ දැවීම කරන්නාවූ ධර්මයෙකි.

තවද නිරය තිරිසන් ප්‍රේත අසුර දිව්‍ය මනුෂ්‍ය භූමින්හි මෙසේ ශෝක පරිදේව දුක්ඛ දෞමනස්ස උපායාසාග්නීහු ඇත්තාහු වෙත්. බ්‍රහ්ම භූමියෙහි ශෝකාදී පස්දෙන නැත්තාහු වෙත්. කුමක් හෙයින්ද යත්? ඒ ධර්මයෝ කාම තෘෂ්ණාව පිළිබඳව හටගන්නා හෙයිනි.

මෙතෙකින් උපායාසාග්නීය සැකෙවින් දක්වන ලදී.

අනවරාග්‍ර සංසාරයෙහි අලෝභ ප්‍රධාන දාන, සීල, භාවනා කුශලයෝ තෘෂ්ණා සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. අද්වේෂ ප්‍රධාන දාන, සීල, භාවනා කුශලයෝ ද්වේෂ සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. අමෝහ ප්‍රධාන දාන, සීල, භාවනා කුශලයෝ අවිද්‍යා සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. ඒ ඒ භූමින්හි වයසම්පත්ති සියල්ල වයෝහානි සඞ්ඛ්‍යාත ජරා සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. වර්ණ සම්පත්ති සියල්ල වර්ණහානි සඞ්ඛ්‍යාත ජරා සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. බලසම්පත්ති සියල්ල බලහානි සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍යාදීන්ගේ ජීවිත සියල්ල මරණ සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. සත්කාය දිට්ඨිය ඇත්තාවූ ශ්‍රමණ බ්‍රාහ්මණ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ප්‍රීති සියල්ල ශෝක සඞ්ඛ්‍යාත සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. සිනාසීම් සියල්ල පරිදේව සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහ. කායික සුඛ වේදනාවෝ සියල්ල කායික දුක්ඛ සඞ්ඛ්‍යාත සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහ. සතුටුවීම් සියල්ල දෞමනස්ස සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහ. අධික සතුටුවීම් සියල්ල උපායාස සුසාන භූමියෙහි ඇද වැටෙන්නාහුය. අලෝභයාගේ ජාතිය රාග ජාති සඞ්ඛ්‍යාත සුසාන භූමියෙහි ඇද වැටෙන්නේය. අද්වේෂාදී අන්‍ය ධර්මයන් පිළිබඳවද මෙසේම දත යුතුයි

මෙසේ භවත්‍රය දවන්නාවූ එකොළොස් විධ මහ ගිනි ජ්වාලාවට ගිනී පෙනෙලිවී වාසයකරන්නාවූ සත්වයන් විසින් අනවරාග්‍ර සංසාරයෙහි රැස්කරනලද දාන, සීල, භාවනා කුසල් සියල්ලෙන්ද ඒ හේතුවෙන් ලබනලද මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම සම්පත් සියල්ලෙන්ද දූන් ලේශමාත්‍රයකුදු නැත. දැනට ඇත්තාවූ මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම ස්කන්ධ සමූහය හා මතුවට ඇතිවන මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම ස්කන්ධ සියල්ලද එසේම විනාශ වන්නාහ. මෙසේ ගිනිවලින් දැවෙමින් විනාශ වන්නාවූ මේ ලෝකත්‍රයෙහි සැපයක් නම් නැත්තේමය. සත්‍ය වශයෙන් කියතහොත් මුළු ලෝකයම දුක් ගොඩකි. මේ එකොළොස් ගිනිවලින් විනිර්මුක්තවූ ශාන්තවූ ප්‍රණීතවූ නිර්වාණ ක්ෂෙම භූමියට වහා පැමිණෙනු පිණිස මාර්ගාඞ්ග ධර්මයන් වැඩිය යුතුයි.

පාණදුරේ රත්කොත් විහාරාධිවාසී

ආභිධර්මික

# පානදුරේ සෝමරතන ස්ථවිරයන් වහන්සේ

විසින් ලියන ලද


සධර්ම මධුව නම.

## "නිබ්බාන පච්චයො හොතු."

පූතිමච්ඡං කුසග්ගෙන
යො නරො උපනය්හති
කුසාපි පූති වායන්ති
එවං බාලූපසෙවනා

ඉමිනා පුඤ්ඤකම්මෙන
යාව නිබ්බානපත්තියා
සතං සමාගමො හොතු
මා මෙ බාලසමාගමො

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු